සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

54 | S | I

තෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2018

## Third Term Test - Grade 12 - 2018

විභාග අංකය ..................................

## පෙරදිග සංගීතය I

කාලය පැය දෙකයි

උපදෙස්

- ♦ සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ♦ උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ විභාග අංකය ලියන්න.
- ♦ 1 සිට 25 තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් නිවැරදි පිළිතුර තෝරාගෙන එයට හිමි අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.
- ♦ 26 - 50 දක්වා උත්තර පත්‍රයේම පිළිතුරු සපයන්න.

01. ථාඨයකට අයත් වන්නේ,
i. ආරෝහණ ස්වර පමණි  ii. වාදි සංවාදී ස්වර පමණි.  iii. අනුවාදි ස්වර පමණි
iv. විවාදි ස්වර පමණි  v. විකෘති ස්වර පමණි  (........)

02. ආරෝහණයේදී ගාන්ධාරය හා නිශාදය වර්ජිත වන ඖඩව සම්පූර්ණ රාගය
i. දේස් රාගයයි.  ii. තිලක්කාමෝද් රාගයයි.  iii. ආසාවරී රාගයයි.
iv. බාගේශ්‍රී රාගයයි.  v. ජෞනපුරි රාගයයි.  (........)

03. 'රූ රුසේ අඳිනා ලෙසේ අත්' යන සේ ගී පාදයේ ඇතුලත් ලඝු ගුරු මාත්‍රා සංඛ්‍යා පිළිවෙලින් දක්වන්න.
i. 3 - 5 කි.  ii. 4 - 4 කි.  iii. 4 - 5 කි.  iv. 5 - 4 කි  v. 6 - 4 කි.  (........)

04. | ර න් ර | සා S S | සේ S ම | ව ඩ න | යන සබරගමු වන්නම් ගී පාදයෙහි ඇතුළත් සැඳැස්මත් හා ගීමත් සංඛ්‍යාව පිළිවෙලින්
i. 8 හා 11 කි  ii. 10 හා 12 කි  iii. 11 හා 12 කි
iv. 11 හා 14 කි  v. 12 හා 16 කි  (........)

05. ගායන සමය රාත්‍රී II ප්‍රහරයේ ගැයෙන ඨුම්රි ගායනය සඳහා විශේෂ වූ ෂාඩව සම්පූර්ණ රාගය කුමක්ද?
i. බාගේශ්‍රී රාගය  ii. දේස් රාගය  iii. ආසාවරී රාගය
iv. තිලක්කාමෝද් රාගය  v. ජෞනපුරි රාගය  (........)

06. සමප්‍රකෘති රාග යුගලයකි.
i. දේස් - භීමපලාසී  ii. ආසාවරි - ජෞනපුරි  iii. බාගේශ්‍රී - තිලක්කාමෝද්
iv. ආසාවරි - දේස්  v. ජෞනපුරි - තිලක්කාමෝද්  (........)

07. මීන්ඩ් භාවිතය සඳහා උචිත **නොවන** ස්වර යුගලය තෝරන්න.
i. ස, ප  ii. ප, රි  iii. ප, ප  iv. ප, සං  v. නි ප  (........)

08. ආරෝහණ / අවරෝහණයේදී නිශාදය දෙයාකාරයෙන් යෙදෙන නිර්දේශිත රාගය කුමක්ද?
i. තිලක්කාමොද්  ii. බාගේශ්‍රී  iii. කාෆි  iv. භෛරවී  v. දේස්  (........)

09. පිළිවෙලින් පූර්වාංගවාදී හා උත්තරංගවාදී රාග යුගලය අයත් පිළිතුර කුමක්ද?

i. ආසාවරී / ජෞනපුරි    ii. බාගේශ්‍රී / දේස්    iii. ආසාවරී / දේස්
iv. දේස් / තිලක්කාමෝද්    v. තිලක්කාමෝද් / ආසාවරී (........)

10. චතුරංග ගායන ශෛලියට අයත් අංග 04 පිළිවෙලින් සඳහන් පිළිතුර කුමක්ද?

i. ඛ්‍යාල්, තරාණා, සර්ගම්, තිර්වට්    ii. තිර්වට්, සර්ගම්, තරාණා, ඛ්‍යාල්
iii. තරාණා, සර්ගම්, නිර්වට් ඛ්‍යාල්    iv. සර්ගම්, තිර්වට් ඛ්‍යාල්, තරාණා
v. තිර්වට් ඛ්‍යාල් තරාණා සර්ගම් (........)

11. ශෘංගාරයෙන් පිරි සරල ශාස්ත්‍රිය ගායන ශෛලියක් වන්නේ,

i. ධ්‍රැපද්    ii. ඛ්‍යාල්    iii. ගසල්    iv. භජන්    v. චතුරංග (........)

12. ස්ලෙන්ද්‍රෝ සහ පෙලොග් ලෙස ස්වර සාධන දෙකකින් යුක්ත වන්නේ,

i. භාරතීය සංගීත පද්ධතියේ ය.    ii. අප්‍රිකානු සංගීත පද්ධතියේ ය.
iii. ග්‍රැමිලෑන් සංගීත පද්ධතියේ ය.    iv. ඉස්ලාම් සංගීත පද්ධතියේ ය.
v. චීන සංගීත පද්ධතියේ ය. (........)

13. බටහිර සංගීතයේ ප්‍රධාන හඬතල හතර පිළිවෙලින් ඇතුලත් පිළිතුර වන්නේ,

i. SOPRANO, ALTO, TENNER, BASS    ii. BASS, TENNER, SOPRANO, ALTO
iii. ALTO, SOPRANO, TENNER, BASS    iv. SOPRANO, BASS, ALTO, TENNER
v. SOPRANO, BASS, TENNER, ALTO (........)

14. | ස නි ධ නි | ස - ම ග | ම ධ නි ස් | ධ නි ස් - |

ඉහත ප්‍රස්තාරයේ ස්වර රචනාව කුමන රාගයක් ඇසුරෙන් නිර්මාණය වී තිබේද?

i. දේස්    ii. ආසාවරි    iii. ජෞනපුරි
iv. තිලක්කාමෝද්    v. භාගේශ්‍රී (........)

15. ගද්‍ය හා පද්‍ය දෙයාකාරයම දැකිය හැකි වන්නේ,

i. පැල් ගී වල ය.    ii. බඹර ගී වල ය.    iii. ගැල් ගී වල ය.
iv. ටීකා සී පදවල ය.    v. පාරු ගී වල ය. (........)

16. ධමාර් හා චෞතාල් වාදනය කරනු ලබන හිංදුස්ථානි අවනද්ධ වාද්‍ය භාණ්ඩය කුමක්ද?

i. තබ්ලා    ii. සටම්    iii. මෘදංගම්
iv. පක්වාජ්    v. චෙංඩා (........)

17. ඒකලව ගැයීමට වඩාත් සුදුසු ගැමි ගී පමණක් ඇතුලත් පිළිතුර කුමක්ද?

i. ගොයම් - නෙළුම් - කමත්    ii. තේරවිලි - ශාන්තිකර්ම ගී - නෙළුම් ඕසය
iii. ගැල් ගී - පතල් ගී - කෙළි ගී    iv. නැලවිලි ගී - ගැල් ගී - පැල් ගී
v. නෙළුම් ගී - බඹර ගී - ඔන්චිලි වාරම් (........)

18. නාඩගම් නාට්‍ය සම්ප්‍රදායෙහි අපතාලාත්මකව මුලින්ම ගායනා කරනු ලබන ගීත කොටස හඳුන්වන්නේ,

i. තෝඩායම නමිනි.    ii. දොහොරාව නමිනි.    iii. අංගහාරං නමිනි.
iv. උරුට්ටුව නමිනි.    v. ඉන්නිසය නමිනි. (........)

19. උත්තර භාරතීය හා දක්ෂිණ භාරතීය සංගීත පද්ධතිවල ප්‍රධාන ස්වර වාද්‍ය හා තාල වාද්‍ය භාණ්ඩ පිළිවෙලින් ඇතුළත් පිළිතුර කුමක්ද?

i. වීණාව - මෘදංගය / සිතාරය - තබ්ලාව    ii. තබ්ලාව - එස්රාජය / මෘදංගය - වයලීනය
iii. සිතාරය - මෘදංගය / වීණාව - තබ්ලාව    iv. සිතාරය - තබ්ලාව / වීණාව - මෘදංගය
v. සන්තූර්ය - තබ්ලාව / තාම්පුරාව - පක්වාජය (........)

20. 'මීරාබායි' තුල්සිදාස් වැනි පද්‍ය රචකයින් මූලික කරගත් ගායන ශෛලිය කුමක්ද?
   i. ගසල් ii. තරාණා iii. භජන් iv. ධ්‍රැපද් v. ඛ්‍යාල් (........)

21. පහත අවනද්ධ අක්ෂර වලින් යුත් කොටස හැඳින්විය හැකි වඩාත්ම සුදුසු පිළිතුර කුමක්ද?

   x 2 0 3
   | තිට කත ගධි ගන | ධා ++ තිට කත | ගධි ගන ධා ++ | තිට කත ගධි ගන | ධා
   i. චක්‍රදාර්ය ii. තිහායිය iii. ගත්ය iv. පරන් ය v. මුඛඩාය. (........)

22. කණ්ඩායම් නායකත්වයට ගරුකරමින් දීර්ඝ යති සහිතව සාමූහිකව ගයන ඕසේ ගායනය දැකිය හැකි ගී විශේෂයකි.
   i. කමත් ගී ii. ගොයම් ගී iii. කෙළි ගී iv. ගැල් ගී v. නෙළුම් ගී (........)

23. කර්ණාටක සම්ප්‍රදායට අනුව වයලීනයේ 4,3,2,1 තත් සුසර කරන පිළිවෙළ වන්නේ,
   i. ප̣ ස ප ස̇ ක්‍රමයයි. ii. ප̣ රි ධ ග̇ ක්‍රමයයි.
   iii. ම̣ ස ප රි ක්‍රමයයි. iv. ස̣ ප̣ ස ප ක්‍රමයයි.
   v. ම̣ ස ප ස̇ ක්‍රමයයි. (........)

24. තුම්බා, මන්කා, තාර්ගහන් ආදී කොටස් වලින් යුක්ත මිස්රාබ් නම් උපකරණයෙන් වයන සංගීත භාණ්ඩය වන්නේ,
   i. එස්රාජයයි. ii. සාරංගියයි. iii. සිතාරයයි. iv. සරෝදයයි. v. සන්තූරයයි. (........)

25. නාද විවරයක් සහිත තත් වාද්‍ය සංගීත භාණ්ඩය තෝරන්න.
   i. සාරංගියයි. ii. සරෝදයයි. iii. එස්රාජයයි. iv. සන්තූරයයි. v. සිතාරයයි. (........)

- **අංක 26 - 50 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු හිස්තැන් මත ලියන්න.**

26. දේස් රාගයෙහි මුඛ්‍යාංගය .................................................. වන අතර තිලක්කාමෝද් රාගයෙහි මුඛ්‍යාංගය .................................................. වේ.

27. බාගේශ්‍රී රාගයේ පංචමය ........................................................... ස්වරයක් ලෙස යොදාගනී.

28. ආරෝහණයේ ස්වර 05 ක් සහ අවරෝහණයේ ස්වර 07 ක් යෙදෙන රාගයක ජාතිය ............................................ වන අතර ............................................. රාගය එම ජාතියට අයත් වේ.

29. සම දෙගුණ තෙගුණ ආදී වශයෙන් ලය ගුණ කිරීම .................................................. ගායන ශෛලීයෙහි විශේෂිත ලක්ෂණයක් වන අතර ඒ සඳහා යොදා ගන්නා ............................................................ යේකාව මාත්‍රා දොළසකින් යුක්තය.

30. නාඩගම් වලදී ............................................................. විසින් චරිත හඳුන්වා දෙනු ලබන අතර කෝලම් වලදී මෙම කාර්ය සිදුකරනු ලබන්නේ ......................................................... චරිතය විසිනි.

31. ඒක ස්වර (Melody) බහු ස්වර (Harmony) යන සංකල්පයන් මත පිළිවෙලින් ................................ සංගීත පද්ධතිය හා ................................................ සංගීත පද්ධතීන් බිහි ව ඇත.

32. රි ම ප සංගතිය නිතර භාවිත වන නිර්දේශිත රාග දෙකක් නම් කරන්න.

   ........................................................................ ........................................................................

33. පූර්වාංගවාදී හා උත්තරාංගවාදී නිර්දේශිත රාග දෙකක් නම් කරන්න.

   ........................................................................ ........................................................................

34. වයලීනය හා සිතාරය සූක්ෂම ලෙස සුසර කර ගැනීම (fine Tuning) සඳහා යොදා ගැනෙන කොටස් දෙක පිළිවෙලින් නම් කරන්න.

   ........................................................................ ........................................................................

35. සමප්‍රකෘති රාග යුගල දෙකක් නම් කරන්න.

   ........................................................................ ........................................................................

36. උතුරු ඉන්දීය සංගීතයේ ඛ්‍යාල් ගායන ශෛලිය හා ධ්‍රැපද් ගායන ශෛලිය හා සම්බන්ධ සංගීතඥයන් දෙදෙනෙකු පිළිවෙලින් නම් කරන්න.

........................................................................ ..........................................................................................

37. ජාවා සුමාත්‍රා දූපත්වල බිහි වී දැනට ඉන්දුනීසියාවේ පවතින ශිල්පීය සංගීතය ............................................ නමින් හැඳින්වේ. එය ප්‍රචලිත කිරීමට පර්යේෂණ කළ එක් සංගීතඥයෙක් ලෙස ........................................ හැඳින්විය හැකිය.

38. ඉස්ලාමික සංගීතය .................................................... සංගීතය ලෙස ද ලොව ජනප්‍රිය වී ඇති අතර එහි පැරණිම ජන ගීතය ............................................................ ලෙස හඳුන්වයි.

- **පහත දී ඇති පාරිභාෂික වචන ආධාර කරගෙන අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

**(තිහායි / ධුන් / ගමක් / ජලා / මුඛඩා)**

39. ගායනය සඳහා අදාල නොවන කරුණු යුගලය නම් කරන්න. ....................................................................... ....................................................................................

40. ශාස්ත්‍රීය ඒකල තබ්ලා වාදනය සඳහා අදාල වන කරුණු යුගලය නම් කරන්න.

........................................................................ ..........................................................................................

41. තානාලංකාරවල අන්තර්ගත විය හැකි කරුණු යුගලය නම් කරන්න.

........................................................................... ...................................................................................

42. දේශීය තිත් තාල පද්ධතිය අනුව තනි තිතේ සහ දෙතිතේ ප්‍රභේද සංඛ්‍යාව පිළිවෙලින් ලියන්න.

......................................................................... ....................................................................................

43. මහනුවර යුගයේ රාජසභා සංගීත ආයතනවල සේවය කළ කර්නාටක සංගීතඥයින් දෙදෙනෙකු නම් කරන්න.

........................................................................... ....................................................................................

44. භාරතීය සංගීතය වෛදික යුගය, ......................................................................................., හිංදු යුගය, ......................................................................, ලෙස යුග 04 කි.

.........................................................................................................................................................................

45. ශ්‍රී ලංකාවේ මුල් යුගයේ සංගීතඥයන් විසින් නිර්මිත ග්‍රන්ථ අතරින් සිංහල නාට්‍ය කලාව පිළිබඳ ලියැවුණු ............................................ ග්‍රන්ථය ........................................... ශූරීන් විසින් රචනා කොට ඇත.

46. ඛ්‍යාල් ගායන ශෛලියේ මධ්‍යලය ගීත ............................................ ඛ්‍යාල් ලෙසද විලම්භලය ගීත ...................................................... ඛ්‍යාල් ලෙසද හඳුන්වයි.

47. ජාවා, සුමාත්‍රා, ආදී දූපත්වල ප්‍රචලිත ........................................................... සංගීත පද්ධතිය වාද්‍ය සංගීතය ප්‍රමුඛ කොටගත් සංගීත පද්ධතියක් වන අතර මෙහි බහුලව භාවිතා වන්නේ ............................................... වාද්‍ය භාණ්ඩයෝය.

48. ධ්‍රැපද් ගායන ශෛලියේ ආරම්භකයා ........................................ පඬිතුමා වන අතර බෘහද්දේශී ග්‍රන්ථය රචනා කරන ලද්දේ ................................................... පඬිවරයාය.

.........................................................................................................................................................................

49. කෝමල නිශාදය ($B^b$) Key signature ලෙස යොදා රේඛා මණ්ඩලයේ ස්වර ප්‍රස්තාර කරන්නේ ................................. MAJOR SCALE වලදී හා ................................................ MINOR SCALE වලදී ය.

50.




ඉහත බටහිර රේඛා මණ්ඩලයේ මධ්‍යම භාවයෙන් ස්වර ප්‍රස්තාර කිරීමේදී Key Signature සඳහා FLAT (b) සංකේතය යොදනු ලබන්නේ .................................... වෙනි රේඛාව මත වන අතර පංචම භාවයේදී Key Signature සඳහා Sharp (#) සංකේතය යොදන්නේ ............................................ වෙනි රේඛාවේ ය.

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

54 | S | II

තෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2018

**ThirdTerm Test - Grade 12 - 2018**

විභාග අංකය .................................. පෙරදිග සංගීතය II කාලය පැය තුනයි

වැදගත්
I කොටසින් ප්‍රශ්න දෙකකට ද II කොටසින් ප්‍රශ්න එකකට ද III වන කොටසින් ප්‍රශ්න දෙකකට ද ආදී වශයෙන් ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න. සෑම ප්‍රශ්නයකටම ලකුණු 20 බැගින් ලැබේ.

## I කොටස

01. පහත දැක්වෙන ස්වර සංගතීන් කුමන රාගයකට අයත් දැයි නම් කරන්න.

a. රිමපධ මගරි, මගරිගනිස, රිමපනිස්
b. මපධධස්, පගරිස, රිනිධප
c. ගමධනිධ ම, මපධ ග, මගරිස
d. පනිසරිග සනි, රිමපධ, මපස්
e. පධනිස්, නිස්ධප, ධධපමපගරි, සරිමප (ල. 05)

ii. " C " රාගයට අදාලව එහි මේලය, වාදී සංවාදී ස්වර, ආරෝහණ, අවරෝහණ ලියන්න. (ල. 05)

iii. ඉහත රාග අතරින් B සහ E රාග යුගලයෙහි සම විෂමතා ලක්ෂණ තුන බැගින් සංසන්දනය කරන්න. (ල. 06)

iv. B රාගයට අයත් මධ්‍යලය ගීතයක හෝ වාදිතයක ස්ථායි කොටස පමණක් නියමිත තාල සංඥා සහිතව ස්වර ප්‍රස්තාර කරන්න. (ල. 4) ( මුළු ලකුණු 20)

02. නිර්දේශිත රාග කීපයකට අදාළ කරගත හැකි තොරතුරු කීපයක් පහත දැක්වේ.

a. අවරෝහණයේදී රිෂභය වක්‍රව යෙදෙන, බමාජ් මේලගත රාගයකි. (ල. 01)
b. ම, ස ස්වර වාදී, සංවාදී වන ඖඩව ජාති රාගයකි. (ල. 01)
c. කෝමල ස්වර තුනක් යෙදෙන ඖඩව සම්පූර්ණ රාගයකි. (ල. 01)
d. රාත්‍රි තුන්න ප්‍රහරයෙහි ගැයෙන කාෆි මේලගත රාගයකි. (ල. 01)

i. ඉහත තොරතුරු අනුව එක් එක් රාගය නම් කරන්න. (ල. 04)

ii. a සහ c යන රාගවල අදාලව මාත්‍රා අටකට නොඅඩු තානාලංකාර දෙක බැගින් වෙන් වෙන්ව ලියා දක්වන්න. (2 x 4 = 08)

iii. "d" රාගයට ආදාලව ස්වර සංගතීන් ඇසුරින් ස්වර 30 කට නොඅඩු ආලාප බණ්ඩයක් ලියා දක්වන්න. (ල. 08) (මුළු ලකුණු 20)

03. ''භාරතීය රාගධාරී සංගීතය උත්තර සහ දක්ෂිණ භාරතීය වශයෙන් පද්ධති දෙකකි.''

i. පහත දැක්වෙන ශිර්ෂ ඔස්සේ එම පද්ධති දෙකෙහි සම විෂමතා දක්වන්න.

(a) ස්වර (b) තාල (c) ස්වර වාද්‍ය භාණ්ඩ හා තාල වාද්‍ය භාණ්ඩ (ල. 06)

ii. තාරාණා, ගසල්, භජන්, ඛ්‍යාල්, චතුරංග, ධ්‍රැපද්, හා ධමාර් යන ගායන ශෛලීන් අතරින් යුගල දෙකක් නම් කර ඒවා අතර සම විෂමතා දෙක බැගින් සඳහන් කරන්න. (ල. 08)

iii. ධ්‍රැපද් හා ධමාර් ගායනා ශෛලීන් හා බැඳුණු හින්දුස්ථානි තාල දෙක නම් කර ඉන් එක් තාලයක සමගුණය නියමිත තාල සංඥා සමඟ ප්‍රස්තාර කරන්න. (ල. 06)

(මුළු ලකුණු 20)

## II කොටස

04. පහත සඳහන් කරුණු හතරෙන් ඔබ කැමති දෙකක් තෝරාගෙන උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

i. සොකරි ගැමි නාටකය තුළින් හෙලිවන ශාන්තිකර්ම ලක්ෂණ

ii. කෝලම් රංග සම්ප්‍රදාය තුළින් හාස්‍ය ජනකව ඉදිරිපත් කරන තත් සමාජයේ පැවැති දුර්වලතා

iii. නාඩගම් සංගීතය කෙරෙහි කර්ණාටක සංගීතයේ බලපෑම

iv. නූර්ති සංගීතයේ රාගාධාරී පසුබිම (ල. 2 x 10= 20)

05. දේශීය ගැමි සංගීතය තුළින් හෙළිවන පහත සඳහන් කරුණු පිළිබඳව පැහැදිලි කරන්න. (උදාහරණ දෙකක් සැහේ)

i. සාමූහිකත්වය පිළිබිඹු කරන අවස්ථා


ii. දාර්ශනික බව පිළිබිඹු කරන අවස්ථා

iii. සන්නිවේදන කාරකයක් ලෙස යොදාගත් අවස්ථා

iv. සාරධර්ම හා අයගන් පිළිබඳ පිළිබිඹු වන අවස්ථා (ල. 4 x 5= 20)

## III කොටස

06. i) පහත සඳහන් බටහිර රේඛා මණ්ඩයේ ප්‍රස්තාරය ඇසුරෙන් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.



i. ඉහත ප්‍රස්ථාරය පෙරදිග ක්‍රමයට හරවා ප්‍රස්තාර කරන්න. (ල.08)

ii. ඔබ විසින් ලියන පංචම භාවයෙන් ඇති ප්‍රස්තාර මධ්‍යමය භාවයට හරවා නැවත ලියන්න. (ල.04)

iii. මධ්‍යම භාවයට හරවන ලද ඔබේ පිළිතුර ඊට අදාල Key signature යොදා බටහිර රේඛා මණ්ඩලයේ නැවත ප්‍රස්තාර කර දක්වන්න. (ල.06)

iv. G major chord එකට අයත් ස්වර හා F major chord එකට අයත් ස්වර වෙන වෙනම පිළිවෙලින් ලියන්න. (ල. 02) (මුළු ල. 20)

07. i. වයලීනය, එස්රාජය, සිතාරය, ගිටාරය, යන භාණ්ඩ අතරින් එක් භාණ්ඩයක දළ රූපසටහනක් ඇඳ එහි ප්‍රධාන කොටස් 06 ක් නම් කරන්න. (ල.10)

ii. වයලීනය, සිතාරය, තබ්ලාව, බටනලාව, ගිටාරය, යන භාණ්ඩ වල ගුණාත්මක භාවය, හීන වීම කෙරෙහි බලපාන සාධක දෙක බැගින් විස්තර කර ලියන්න. (ල. 10)

(මුළු ලකුණු 20)

08. i. රාගධාරී ශාස්ත්‍රීය පදනමක් සහිත සරල ගීතයක දැකිය හැකි රාගධාරී අංග හතරක් නම් කරන්න. (ල. 04)

ii. ඔබ උගත් රාගධාරී ශාස්ත්‍රීය ගීතයක් ඇසුරෙන් එම අංග 04 උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ල. 13)

iii. ඔබ තෝරාගත් ගීතයේ පද රචකයා, සංගීතඥයා, ගායකයා හෝ ගායිකාව නම් කරන්න. (ල. 03)

(මුළු ලකුණු 20)

## තෙවන වාර පරීක්ෂණය - 2018
## පෙරදිග සංගීතය 12 ශ්‍රේණිය
## I පත්‍රය

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 1. | i | 11. | iii | 21. | ii | |
| 2. | iii | 12. | iii | 22. | v | |
| 3. | iii | 13. | i | 23. | iv | |
| 4. | iii | 14. | v | 24. | iii | |
| 5. | iv | 15. | iv | 25. | iv | 1 x 25 = 25 |
| 6. | ii | 16. | iv | 26. | රිමප, නිධප / පධපමගරිගස | |
| 7. | iii | 17. | iv | 27. | ආගන්තුක ස්වරය | |
| 8. | v | 18. | v | 28. | ඖඩව සම්පූර්ණ / ආසාවරි | |
| 9. | v | 19. | iv | 29. | ධ්‍රැපද් / චෞතාලයේ | |
| 10. | i | 20. | iii | 30. | පොතේ ගුරු / සබේ විදානේ (කාරිය කරවන රාළ) | |

31. පෙරදිග / අපරදිග
32. දේස්, ආසාවරි, ජෞනපුරි
33. බාගේශ්‍රී, දේස්, තිලක්කාමෝද්, මාලකෞන්ස් / ආසාවරි, ජෞනපුරි
34. ඇජෙස්ටස් / මන්කා
35. දේස් තිලක්කාමෝද් / ආසාවරි, ජෞනපුරි
36. අමීර් ඛාන්, බිම්සෙන් ජෝසි / අමීර් කුෂ්රු, පණ්ඩිත් ජස් රාජ් / පර්වීන් සුල්තානා සාරාංගදේව පඬිතුමා
37. ගැමිලෑන් සංගීතය ජාප් කුන්ස්ට්, මැන්ටල් හුඩ්, ජෝස් මැසිඩා
38. මකාමත් සංගීතය, ආසාන් පාඨය
39. ධූන්, ජලා
40. තිහායි, මුඛඩා
41. තිහායි, ගමක්
42. 3 3
43. ගණිතාලංකාර, අලගනායිඳු, නාරසිංහ
44. පශ්චාත් වෛදික යුගය, බ්‍රිතාන්‍ය යුගය
45. සිංහල ගැමි නාටකය, එදිරිවීර සරච්චන්ද්‍ර ශූරීන්
46. චොටා, බඩා
47. ගැමිලෑන්, තාඩ්‍ය
48. සාරංගදේව පඬිතුමා, මාතාංග පඬිවරයා
49. F, D
50. 3 - 5 **(26 සිට 50 දක්වා පිළිතුරු වලට ලකුණු භාග (½ ) හිමි නොවේ.)**

(ලකුණු 50x2 = 100)

## දෙවන වාර පරීක්ෂණය - පෙරදිග සංගීතය 12 ශ්‍රේණිය
## II පත්‍රය

- **I, II, III කොටස් වලින් නිවැරදිව ප්‍රශ්න තෝරා ගත යුතුය.**

01. i a දේස් රාගය b. ආසාවරි රාගය c. බාගේශ්‍රී රාගය d. තිලක්කාමෝද් රාගය e. ජෞනපුරි රාගය (ල. 05)
ii බාගේශ්‍රී රාගයට අදාල තොරතුරු නිවැරදි නම් කිරීමට (ල. 05)
iii ආසාවරි ජෞනපුරි රාග යුගලයේ සමවිෂමතා පැහැදිලි කිරීමට (ල. 06)
iv. ආසාවරී රාගයට අයත් මධ්‍යලය ගීතයක හෝ වාදිතයක ස්ථායි කොටස ප්‍රස්තාර කිරීමට. (ල. 04) (මුළු ල. 20)

02. i. i a දේස් රාගය b. මාලකෞන්ස් රාගය c. ආසාවරී රාගය d. බාගේශ්‍රී රාගය (ල. 04)
ii. දේස්, ආශාවරි යන රාග වලට අදාලව තානාලංකාර ලියා ඇත්නම් (ල. 08)
iii. d = බාගේශ්‍රී රාගයට අදාලව ආලාප ඛණ්ඩය ලියා දැක්වීමට (ල. 08)(මුළු ල. 20)

03. i. අදාල ශිර්ෂ ඔස්සේ කරුණු දැක්වීමට ලකුණු 02 බැගින් 2 x 3 = 06
ii. අදාල ගායන ශෛලීන් හි සම විෂමතා දැක්වීමට ලකුණු 4 x 2 = 08
iii. තාල දෙක නම් කිරීමට (චෞතාල්, ධමාර්) ලකුණු 02
එක් තාලයක සමගුණය ප්‍රස්තාර කිරීමට ලකුණු 04 (මුළු ලකුණු 20)

## II කොටස

04. i. සම්ප්‍රදායන් 02 අදාලව කරුණු ඉදිරිපත් කිරීමට (2 x 10 = 20)

05. අදාල ශීර්ෂ ඔස්සේ කරුණු ඉදිරිපත් කිරීමට ලකුණු (5 x 4 = 20)

(06)

(i) | [illegible] |

2 x 4 (ල = 08)

(ii) [illegible]

| [illegible] |

(ල 04)

(iii)



Key signature [illegible]

(ල 06)

(iv) G - [illegible] - (G B D)

F [illegible] (F A C) (02) [illegible] 20

07. i. දළ රූපසටහන (ල. 04)
 කොටස් 06 නම් කිරීමට (ල. 06)
 ii. සාධක දෙක බැගින් ලකුණු කිරීමට 5 x 2 (ල. 10) (මුළු ලකුණු 20)

08. i. අංග 04 ක් නම් කිරීමට (ල. 04)
 ii. උදාහරණ සහිතව පැහැදිලි කිරීමට (ල. 13) උදාහරණ නැතිවිට ලකුණු 01 ක් අඩු කරන්න. ( 3x 4 = 12)
 iii. අදාල තොරතුරු දැක්වීමට (ල. 03) (මුළු ලකුණු 20)